THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

SUGGESTED SOLUTIONS

05204 - මූලික කළමනාකරණ ගණකාධිකරණය සහ ව්‍යාපාර මූල්‍ය ගිණුම්කරණ සහ ව්‍යාපාර සහතික පත්‍ර විභාගය - II
2013 සැප්තැම්බර්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

හිමිකම් ඇවිරිණි.

පිළිතුරු අංක 01

(අ) පහත සඳහන් දෑ විස්තර ලිවීම අවශ්‍යයි.

- අභ්‍යන්තර ඵලදා අනුපාතය (IRR) 6.6% වඩා සුළු වශයෙන් ඉහලින් ඇති ව්‍යාපෘතීන් පිළිගත් විට සමස්ත ඵලදාව පහල බසී.

- ඉතා අධික ලෙස ණය ගත්විට ව්‍යාපාරයේ අවදානම, ආන්තික ණය අනුපාතය සහ සමස්ත අවදානම් ආධික්‍යය ඉහල යයි.

- දැනට පවතින ප්‍රාග්ධන ව්‍යුහය පවත්වා ගතහොත් ණය ප්‍රාග්ධනයට සමානුපාතිකව කොටස් ප්‍රාග්ධනයද ඉහල දැමීම නිසා භරිත ප්‍රාග්ධන පිරිවැය නැවත 11.4% දක්වා ඉහල යයි.

- නව ප්‍රාග්ධන ව්‍යුහය දිගටම පවත්වා ගතහොත් යම් සීමාවක් දක්වා ණය ප්‍රාග්ධනය ඉහල දැමීය හැකිමුත් ඉන් පසු අනෙකුත් ප්‍රාග්ධන මූලාශ්‍රයන් වෙත යොමු විය යුතුයි.

- ඉහත දෑ සැලකූ විට ව්‍යාපෘති ඇගයීම කල යුත්තේ සමස්ත භරිත ප්‍රාග්ධන අනුපාතයයි.

(ආ) (i) ස්කන්ධ ප්‍රාග්ධන පිරිවැය

ලාභාංශ වර්ධන ආකෘතිය භාවිතයෙන්

$D_1 = D_0 (1 + g)$
$D_1 =$ 5*1.1 = 5.5
g = 10%
P 110

ස්කන්ධ ප්‍රාග්ධන පිරිවැය = $\frac{D_1}{P} + g$ (5.50/110)+10 % = 15.00 %

ණය ප්‍රාග්ධන පිරිවැය

නිදහස් කරන අගය (රු.) = 1,000.00

වාර්ෂික පොලිය (රු.) 122.40 (බදු පසු)

වර්ෂය	මුදල් ප්‍රවාහ	රු.මි.	ව.අ.(9%)	වර්තමාන අගය (රු.)
0	වෙළඳපල අගය	(1,070.00)	1,000	(1.070.00)
1-4	පොලිය	122.40	3,240	396.58
4	නිදහස් කරන අගය	1000.00	0.708	708.00
				34.58

වර්ෂය	මුදල් ප්‍රවාහ	රු.මි.	ව.අ.(12%)	වර්තමාන අගය (රු.)
0	වෙළඳපල අගය	(1.070.00)	1.000	(1.070.00)
1-4	පොලිය	122.40	3.037	371.73
4	නිදහස් කරන අගය	1,000.00	0.636	636.00
				(62.27)

බදු පසු ණය ප්‍රාග්ධන පිරිවැය = 9%+ 12% - 9%) /(34.58 +62.27) x 34.58 = 10.07%

(i) හරිත සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය (පොත් අගය ක්‍රමය)

	අගය (රු.මි.)		පිරිවැය	හ.සා.ප්‍රා.පි. WACC
ස්කන්ධ ප්‍රාග්ධනය	900		15.00 %	10.0%
ණය ප්‍රාග්ධනය	450		10.07%	3.4%
හ.සා.ප්‍රා. පිරිවැය (WACC)	1,350		WACC	13.4%

හරිත සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය (වෙළඳපල වටිනාකම ක්‍රමය)

	පොත් අගය	වෙළඳපල අගය	පිරිවැය	WACC
කොටස් ප්‍රාගධනය	900	1,100	15.00 %	10.4%
ණය ප්‍රාග්ධනය	450	482	10.07%	3.1%
හා.සා.ප්‍රා. පිරිවැය (WACC)		1,582	WACC	13.5%

(i) ශුද්ධ වත්කම් අගය ක්‍රමය

මුළු ශුද්ධ වත්කම් අගය (රු.) = ප්‍රකාශිත ප්‍රාග්ධනය + රඳවාගත් ඉපැයුම්

= 450 + 250 = 700

කොටස් ගණන = 45 (9/20% x 100%)

කොටසක වටිනාකම (රු.) 15.56

මිල ඉපයුම් (P /E) අනුපාතික ක්‍රමය

අදාල කර්මාන්තයේ මිල / ඉපැයුම් අනුපාතිකය	16
සමාගම මිල/ඉපැයුම (කර්මාන්තය x 50%	8
කොටසක ඉපැයුම (රු.)	2
කොටසක වටිනාකම (රු.)	16

(ii)
- වත්කම් සහ වගකීම් නිවැරදිව හඳුනාගෙන අගය කර ඇති බව.
- සමාගමේ වටිනාකම සාධාරණව එහි වත්කම් වටිනාකමින් පිළිඹිබු වන බව.
- සමාගම නොකඩවා පවත්වාගෙන යන බව.
- සියලුම වගකීම් හඳුනාගෙන ගිණුම්ගත කර ඇති බව.

(iii)
- මෙම ක්‍රමය වෙළඳපල පදනම් කරගත් කොටස් අගය කිරීමක නිසා තාත්වික අගයන් ලබා ගත හැක.
- අවශ්‍ය තොරතුරු පහසුවෙන් ලබා ගත හැකි නිසා ගණනය කිරීම පහසු වේ.
- සමාගමේ ඉපැයුම මත පදනම් වී ඇත.

පිළිතුරු අංක 02

(අ) මූල්‍ය ගණකාධිකරණය මූලික වශයෙන් අතීත සහ දැනට ගෙවීමට බැදී ඇති පිරිවැය යොදාගෙන කිසියම් කාලසීමාවක් සඳහා ලාභය හෝ අලාභය ගණනය කරයි. කළමණාකරන තීරණ ගැනීම සඳහා යොදාගන්නා පිරිවැය වනුයේ එම තීරණයෙන් බලපෑමක් ඇති කරණ පිරිවැයයන්ය. එනම් වර්ධනාත්මක පිරිවැයයි. (Incremental cost)

	යාපනය (රු.)	ගාල්ල (රු.)	සටහන
අමුද්‍රව්‍ය A - පවත්නා තොග (මුල් පිරිවැයට)	3,888,000	-	1
අමුද්‍රව්‍ය A - තහවුරු කළ ඇණවුම් (මුල් පිරිවැයට)	5,472,000	-	2
අමුද්‍රව්‍ය A - මෙතෙක් ඉදිරිපත් නොකළ ඇණවුම් (වර්තමාන අගය)	12,000,000	-	3
අමුද්‍රව්‍ය B - පවත්නා තොග (මුල් පිරිවැයට)	-	9,920,000	4
අමුද්‍රව්‍ය C - මෙතෙක් ඉදිරිපත් නොකළ ඇණවුම් (වර්තමාන අගය)	-	14,240,000	5
ශ්‍රමය ප්‍රාදේශකව කුලියට ලබාගත්	17,200,000	22,000,000	6
ව්‍යාපෘති කළමනාකරණය	-	-	7
නවාතැන් සඳහා ප්‍රවාහන පහසුකම්	1,360,000	1,120,000	8
යන්ත්‍ර කුලී ආදායම්	(1,200,000)	-	9
දඩ මුදල්		5,600,000	10
මුළු කොන්ත්‍රාත්තු අගය	38,720,000	52,880,000	
කොන්ත්‍රාත්තු මිල	57,600,000	70,400,000	
ශුද්ධ ලාභය	18,880,000	17,520,000	

මේ අනුව යාපනය ව්‍යාපෘතිය නිර්දේශ කැරේ.

ඉහත ලාභය අනුව යාපනය කොන්ත්‍රාත්තුව නිර්දේශ කළ හැක.

උදා :

ගිලුණු පිරිවැය :- මූල්‍ය ගණකාධිකරණයට අදාල කරගන්නා අතර තීරණ ගැනීමේදී අදාල නොවේ.

ආවස්ථික පිරිවැය :- මූල්‍ය ගණකාධිකරණයට අදාල නොවන අතර තීරණ ගැනීමේදී අදාල වේ.

බෙදූ පිරිවැය :- මූල්‍ය ගණකාධිකරණයේදී අදාල පිරිවැයෙහි නමුත් තීරණ ගැනීමේදී අදාල නොවේ.

අනාගත පිරිවැය :- තීරණ ගැනීමේදී අදාල වුවත් මූල්‍ය ගණකාධිකරණයේදී ගිණුම්ගත නොකරයි.

(ආ) (1) අමුද්‍රව්‍ය A යාපනය ව්‍යාපෘතියට යොදා නොගතහොත් ඉන්පසු ඇති වාසි සහගතව ප්‍රයෝජනය වන ආදේශකයක් ලෙස යොදා ගත හැක. ඉන් රු. මිලියන 3.888 කින් අනාගත මිලදී ගැණුම් වැලැක්විය හැක. (4.32 x .9)

(2) තහවුරු කරන ලද ඇණවුම් අවලංගු කල නොහැකි බව උපකල්පනය කර ඇත. එම නිසා එම පිරිවැය, මොනයම් විකල්පය තෝරා ගත්තද දැරිය යුතුය. මෙම අමුද්‍රව්‍ය ව්‍යාපෘතිය සඳහා යොදා නොගතහොත් වෙනත් ව්‍යාපෘති සඳහා ආදේශකයක් ලෙස යොදා ගත හැක. මේ නිසා අදාල පිරිවැය වන්නේ ආදේශකයේ මිලයි (6.80x .9)

(3) අමුද්‍රව්‍ය මේ වනවිටත් මිලදී ගෙන නැති අතර ව්‍යාපෘතිය භාරගතහොත් පමණක් මිලදී ගනී. ඒනිසා යාපනය ව්‍යාපෘතිය භාර ගතහොත් රු. මිලියන 12 ක් අමතර වියදමක් දැරිය යුතුය.

(4) B අමුද්‍රව්‍ය පොදුවේ භාවිතා කරන ලදී. එනිසා එය නැවත විකිණිය යුතු නැත. එය ගාල්ල ව්‍යාපෘතියට යොදා ගතහොත් මෙම අමුද්‍රව්‍ය නැවත මිලදී ගත යුතු වන අතර ඒ සඳහා රු. මිලියන 9.92 (4.96 x 2)

(5) ගාල්ල ව්‍යාපෘතිය භාර ගතහොත් ඒ නිසා වැඩිවන පිරිවැය රු. මිලියන 14.24 කි.

(6) ශ්‍රමය වැඩිවන පිරිවැයක් ලෙස සලකන අතර එය අදාල පිරිවැයකි.

(7) ව්‍යාපෘති කළමණාකරන පිරිවැය ගිලිනු පිරිවැයකි. අදාල නැත.

(8) මෙම පිරිවැය ව්‍යාපෘතිය භාර ගතහොත් පමණක් දැරිය යුතු වේ.

(9) යාපනය ව්‍යාපෘතිය භාර ගතහොත් ඉතිරිවන පිරියත කුලියට දී රු. මිලියන 1.2 ක ආදායමක් ලබාගත හැක.

(10) ගාල්ල ව්‍යාපෘතිය භාර ගැනීමෙන් යාපනය කොන්ත්‍රාත්තුවෙන් ඉවත්විය හැක්කේ රු. මිලියන 5.6 දඩයකට යටත්වයි.

ප්‍රධාන කාර්යාලයේ වියදම කොයි විකල්පය තෝරා ගත්තද දැරිය යුතු වන අතර එනිසා අදාල නොවේ.
කල්පනික පොලිය සඳහා වෙනස්වන මූල්‍ය ප්‍රවාහයක් නොවන බව උපකල්පනය කර ඇත.
ක්ෂය ගිලුණු පිරිවැයකි. තීරණ ගැනීමේදී අදාල නොවේ.
කළමනාකරණය තීරණ සඳහා යොදා ගනු ලැබෙනුයේ එම තීරණය සමඟ වෙනස් වන/ වැඩිවන පිරිවැයයි.

පිළිතුරු අංක 03

(අ) (i) ඉල්ලුමෙහි මිල නම්‍යතාවය යනු මිල වෙනස් වීම් වලට සාපේක්ෂව ඉල්ලුමෙහි ඇති සංවේදිතාවයි. වෙළඳපලේ ඇති භාණ්ඩයකට ආදේශකයන් ඇතිවන විට හා භාණ්ඩය සඳහා පාරිභෝගිකයන්ගේ ඇති අගය අඩු වන විට එම භාණ්ඩ සඳහා නම්‍ය ඉල්ලුමක් පවතී. එවිට මිලෙහි ඇතිවන සුලු වෙනසකට පවා ඉල්ලුම විශාල ලෙස වෙනස් වේ.භාණ්ඩයක් සඳහා ඇති පාරිභෝගික ඇගයීම වැඩිවන විට හා වෙළඳපලෙහි ඇති ආසන්න ආදේශකයන් සීමිත වන විට එම භාණ්ඩය සඳහා අනම්‍ය ඉල්ලුමක් පවතී. එහි ප්‍රතිඵලයක් වන්නේ මිලෙහි ඇතිවන වෙනසට සාපේක්ෂව අඩු අනුපාතයක් ඉල්ලුම වෙනස්වීමයි.
යම්කිසි භාණ්ඩයක මිල තීරණය කිරීමේදී ඉල්ලුමේ ඇති මිල නම්‍යතාව ඉතා වැදගත් වේ. ඉල්ලුම නම්‍ය වන විට සුලු මිල ඉහලයාමකට සාපේක්ෂව ඉල්ලුම ඊට ඉහල අනුපාතයකින පහල බසී. අනෙක් අතට භාණ්ඩයට ඇත්තේ අනම්‍ය ඉල්ලුමක් නම් මිල ඉහල දැමූවිට ඉල්ලුම ඊට අඩු අනුපාතයකින් පමණක් පහල බසී.

(ii) මිල පැදීම උපක්‍රමය යනු මිල සංවේදිතාව අඩු භාණ්ඩ වෙළඳපොලක් තුල මිල සූරා කැමකට ලක් කිරීමයි. මෙම ක්‍රමය ඉදිරියේදී ඇතිවිය හැකි අනපේක්ෂිත පිරිවැය ඉහළ යාම් හෝ භාණ්ඩය සඳහා නැවුම් ආන්තරක්ෂණය අඩු වීමෙන් ඉල්ලුම පහල යා හැකි විට යොදා ගත හැක. මෙම ක්‍රමය ආදේශකයන් කිහිපයක් ඇතිවිට සුදුසු නොවේ.
විනිවිද යාමේ මිල ප්‍රතිපත්තිය යනු භාණ්ඩය සඳහා මූලික පිලිගැනීම ඉක්මන් කිරීම සඳහා අඩු මිලක් නියම කිරීමයි. අදේශකයන් කිහිපයක් ඇති විට හෝ වෙළඳපලට පහසු ප්‍රවේශයන් ඇති විට මෙම ක්‍රමය යොදා ගැනීම සුදුසු වේ.

		රු. '000
මුලු ROI අගය (50000x20%)		10,000
පොදු ප්‍රධාන කාර්යාල වියදම්		8,600
කර්මාන්ත ශාලා පොදුකාර්ය		6,000
අවශ්‍ය මුලු ලාභය		24,600
සෘජු පිරිවැය (800 RECS)	12,500 x800	10,000
සෘජු පිරිවැය (1600 පැය)	1,600 x4,000	6,400
		16,400
ලාභය සෘජු පිරිවැයෙහි % ලෙස	$\frac{24,600 \times 100}{16,400}$	= 150%
එක් RECS සඳහා මිල	=12,500+12,500 x150%	
	= 31,250	
පැය 1600 වියදම		6,400
150% වූ ලාභය		9,600
අයකළ හැකි පැය ගණන	=1600 x75% 1,200	16,000
අයකළ හැකි පැයකට මිල	= $\frac{16,000,000}{1200}$	
	= 13,333.33	

(ii) වාර්ෂික අයවැයගත ලාභ පුරෝකථනය

රු. '000

විකුණුම් - RECS 800 x 31,250		25,000
සේවා පැකේජය 13,333 x 1,200		16,000
		41,000
RECS නිෂ්පාදන පිරිවැය 800 x 12,500		(10,000)
සේවා පැකේජය සඳහා සෘජු පිරිවැය		(6,400)
		24,600
ස්ථාවර පොදුකාර්ය		(6,000)
ප්‍රධාන කාර්යාල වියදම්		(8,600)
ලාභය		10,000

පිළිතුරු අංක 04

(අ)

උච්ච සහ අවම ක්‍රමය භාවිතයෙන්	ඉහලම නිෂ්පාදනය	පහලම නිෂ්පාදනය
නිෂ්පාදනය ඒකක	300,000	200,000
නිෂ්පාදන පොදු කාර්ය (රු.'000 .)	13,500	12,000
නිෂ්පාදනයේ වෙනස		100,000
එහි විචල්‍ය පිරිවැය		1,500,000
ඒකක විචල්‍ය පිරිවැය		15.00
10% ඉහලයාම සමඟ		**16.50**
මුලු ස්ථාවර පිරිවැය (රු.'000)	9,000	9,000
10% ඉහලයාම සමඟ (රු.'000)	9,900	9,900
ඒ නිසා Y = 9,900,000 + 16.5 X		

Y = මුළු පිරිවැය

X = නිෂ්පාදනය කරන ලද බෝතල් ගණන

(ආ) 250,000 නිෂ්පාදනය මට්ටමේදී

ස්ථාවර පොදුකාර්ය	9,900,000
විචල්‍ය පිරිවැය (16.5 x 250,000)	4,125,000
මුළු නිෂ්පාදන පොදුකාර්ය	14,025,000

(ඇ)

අයවැය ගත නිෂ්පාදන මට්ටම =	250,000 බෝතල්	
මුළු පැය ගණන	පැය	12,500
එක් බෝතලයක් සඳහා ශ්‍රම කාලය	මිනිත්තු	3.00
එක් පැයක විචල්‍ය පොදු කාර්ය පිරිවැය		330.00
අයවැය ගත ස්ථාවර පොදුකාර්ය (රු.)		9,900,000
එක් පැයක් සඳහා ස්ථාවර පොදුකාර්ය (රු.)		792.00

(i) විචල්‍ය පොදුකාර්ය පිරිවැය විචලතාවය = (සත්‍ය පැය x ප්‍රමිත පොදු කාර්ය - සත්‍ය වි. පොදුකාර්ය)

= (330 x12,100) - 3,581,600   411,400 වාසි

(ii) විචල්‍ය පොදුකාර්ය කාර්යක්ෂමතා විචලනය = (සත්‍ය නිෂ්පාදනයට ප්‍රමිත පැය - සත්‍ය පැය)

= [(3x240,000)/60 - 12,100)330]   33,000 අවාසි

(iii) ස්ථාවර පොදුකාර්ය වියදම් විචලනය = අයවැයගත පොදු කාර්ය - සත්‍ය පොදුකාර්ය
= (9.9mn - 8.9mn) 1,000,000 වාසි

(iv) ස්ථාවර පොදුකාර්ය පරිමා විචලනය = (සත්‍ය නිෂ්පාදන - අයවැයගත නිෂ්පාදන) ප්‍රමිත පොදුකාර්ය ඒකකයකට
= (240,000 - 250,000) x 792/60x3 (396,000) අවාසි

(v) ස්.පි. පරිමාන ධාරිතා විචලනය (සත්‍ය පැය - අයවැය පැය) ප්‍රමිත රේටය
= (12,100 - 12,500) x 792 (316,800) අවාසි

ස්.පි. පරිමාන කාර්යක්ෂමතා විචලනය (ප්‍රමිත පැය - සත්‍ය පැය) පැයක ප්‍රමිත රේතය
= (12,000 - 12,500) x 792 (79,200) අවාසි

පිළිතුරු අංක 05

(1) (අ)නිෂ්පාදන අයවැය

	ඔක්.	නොවැ.	දෙසැ.	ජන.
විකුණුම්	10,000	12,000	9,000	11,000
මුල් නිමිද්‍රව්‍ය	(2,000)	(2,400)	(1,800)	
අවසන් නිමි ද්‍රව්‍ය	2,400	1,800	2,200	
නිෂ්පාදනය	10,400	11,400	9,400	

(ආ) අමුද්‍රව්‍ය අයවැය - මූලක තෙල් (ලීටර්)

	ඔක්.	නොවැ.	දෙසැ.
මූලික තෙල් ලීටර්	156,000	171,000	141,000
මුල් තොගය	(31,200)	(34,200)	
අග තොගය	34,200	28,200	
මිලට ගැණුම්	159,000	165,000	

අමුද්‍රව්‍ය අයවැය - A රසායනික ද්‍රව්‍ය

	ඔක්.	නොවැ.	දෙසැ.
සායනික ද්‍රව්‍ය - A කිලොග්‍රෑම්	52,000	57,000	47,000
මුල් තොගය	(10,400)	(11,400)	
අග තොගය	11,400	9,400	
මිලට ගැණුම්	53,000	55,000	

(ඇ) පුරෝකථනය කරන ලද ආදායම් ප්‍රකාශය.

		ඔක්. (රු. 000)
විකුණුම් (10000 කෑන් සදහා)		35,000.00
10,000 කෑන් සදහා විකුණුම් පිරිවැය		
අමුද්‍රව්‍ය - මූලික තෙල්	(15,000.00)	
A රසායනකය	(10,000.00)	
ශ්‍රමය	(1,000.00)	
විචල්‍යය පොදුකාර්ය	(500.00)	
ස්ථාවර කම්හල් පොදුකාර්ය	(1500.00)	(28,000.00)
දළ ලාභය		7,000.00
කම්හල් පොදුකාර්ය අධි අවශෝෂනය		60.00
අඩු කළා : පරිපාලන හා විකුණුම් පොදුකාර්ය		(2,000.00)
මෙහෙයුම් ශුද්ධ ලාභය		5,060.00

(ඈ) මුදල් අයවැය

ලැබීම්	ඔක්තොබර් රු.'000
ණයගැතියන්ගෙන්	25,200.00
අත්පිට විකුණුම්	7,000.00
මුලු ලැබීම්	32,200.00

වියදම්	
අමුද්‍රව්‍ය - මූලික තෙල්	15,900.00
අමුද්‍රව්‍ය - A රසායනකය	10,600.00
ශ්‍රමය	1,040.00
විචල්‍ය පොදුකාර්ය	520.00
කම්හල් පොදුකාර්ය	1,000.00
පරිපාලන සහ විකුණුම් වියදම්	1,700.00
මුළු වියදම්	30,760.00
ශුද්ධ මුදල් ප්‍රවාහය	1,440.00
මුල් මුදල් ශේෂය	200.00
අග මුදල් ශේෂය	1,640.00

පිළිතුරු අංක 06

(අ) නිෂ්පාදිත වියදම් යනු නිෂ්පාදනය කරන හෝ මිලදී ගන්නා ලද භාණ්ඩ සමග හඳුනාගන්නා පිරිවැයයි. මෙම වියදම් නිෂ්පාදිතය සමඟ බැඳි අතර තොග අගය කිරීමේදී ඇතුලත් කර ගනී.

උදා : මිලට ගැණුම් පිරිවැය, ඍජු ශ්‍රමය, නිෂ්පාදන පොදුකාර්ය , විචල්‍යය නිෂ්පාදන වියදම් යනාදිය.

කාල පිරිවැය යනු තොග අගය කිරීමේදී අදාල කර නොගන්නා , එහෙයින් අදාල කාලය තුලදී වියදමක් ලෙස සලකනු ලබන පිරිවැයයි.

උදා : කළමණාකරන වේතනය, පරිපාලන වියදම්.

(ආ) ආවස්ථිත පිරිවැය යනු කිසියම් වූ විකල්පයක් තෝරාගත් විට ඒ නිසා අතහැරීමට සිදුවන ඊළඟ හොඳම විකල්පයේ අගයයි.

උදා : රු. 500,000 /- මිලදී ගන්නා ලද අමුද්‍රව්‍ය තොගයක වර්තමාන අලෙවි කල හැකි වටිනාකම රු. 100,000 කි. මෙම තොගයේ යලි ක්‍රියා කර වෙනයම් දෙයක් සඳහා යොදා ගන්නේ නම් මෙහි ආවස්ථිත පිරිවැය වනුයේ ශුද්ධ උපලබ්ධි අගය වන රු. 100,000 කි.

(ඇ)

ශ්‍රම රේටය ගණනය කිරීම

මූලික වැටුප + දීමනා 3500 x 12	42,000
අනෙකුත් ප්‍රතිලාභ 1000 x 12	12,000
	54,000
දිනක පිරිවැය 54000/300 = 180	
අඩුකලා ලෙඩ නිවාඩු 180 x 20 x.5	(1,800)
	52,200
වැඩකරන පැය ගණන (300 - (30+20)) x 8	2,000
ප්‍රමිත ශ්‍රම පැය රේටය 52200/2000	26.10
ලෙඩ නවාඩු නැතිනම් ප්‍රමිත ශ්‍රම රේටය $\frac{54000}{(300-30) \times 8}$	25

(ඇ) වියදම් පත්‍රිකාව

	ඒකක 4000	
	මුළු ගණන (රු.)	ඒකකයකට (රු.)
යොදාගන්නා ලද රෙදිපිලි	80,000.00	20.00
සෘජු කුලිය	50,000.00	12.50
නිෂ්පාදන පොදුකාර්ය	32,000.00	8.00
කම්හල් පිරිවැය	162,000.00	40.50
කම්හල් පොදුකාර්ය 10%	3,200.00	0.80
	165,200.00	41.30
අග තොගය (41.3 x 400)	(16,520.00)	
	148,680.00	
විකුණුම් පොදුකාර්ය රු. 1.50 බැගින්	5,400.00	1.50
	154,080.00	42.80
ලාභය	25,920.00	7.20
විකුණම් (3600x50)	180,000.00	50,00

පිළිතුරු අංක 07

(අ) පෙරසැර පිරිවැයකරණය යොදා ගනු ලබන්නේ එකිනෙකට සමාන වූ නිමැවුම් ලැබෙන, සෑම නිමැවුම් ඒකකයක් සඳහා එක සමාන අමුද්‍රව්‍ය, ශ්‍රමය හා අනෙකුත් වියදම් දැරීම නිසා තනි නිමැවුමක් සඳහා වියදම් පැවරීමක් අවශ්‍ය නොවන ක්‍රියාවලින් සඳහා යොදා ගැනීම සඳහායි. පෙරසැර පිරිවැයකරණය රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන ක්‍රියාවලියේදී තෙල පිරිපහදු ක්‍රියාවලියේදි යොදා ගනී.

නමුදු, එක් ඒක් නිමැවුම් ඒකක හෝ නිමැවුම් කාණ්ඩය අනුපමය වන විට කාර්යය පිරිවැයකරණය යොදාගත යුතුවේ. මෙමගින් එක් එක් කාර්යයන් සඳහා වියදම් පැවරීම කල යුතුවේ.
උදා : වාහන අලුත්වැඩියා කිරීමේදී එක් එක් අලුත්වැඩියාව එකිනෙකට වෙනස් නිසා මෙම ක්‍රමය භාවිතා කල යුතුවේ.

(ආ)

		ඒකක
(i)	මුල් ශේෂය	200.00
	ක්‍රියාවලි 1 න්	10,000.00
	සාමාන්‍ය හානිය 5%	(500.00)
	අසාමාන්‍ය හානිය	(100.00)
	අඩ : අග ශේෂය	(300.00)
	නිමි භාණ්ඩ	9,300.00

(ii)	මාරු කරන ලද මුළු ගණන	9,300.00
	මුල් නොනිමි	(200.00)
	මාසය තුල ආරම්භ කර, නිෂ්පාදන අවසන් භාණ්ඩ	9,100.00

(iii) සමානුපාතික ඒකක ගණනය කිරීම.

	ඒකක	පෙරසැර 1 නිමැවුම්	අතිරේක ද්‍රව්‍ය	ශ්‍රමය	පොදුකාර්ය
මුල් නොනිමි	200	-	-	80	80
මාසය තුල ආරම්භ කර නිමකල භාණ්ඩ	9,100	9,100	9,100	9,100	9,100
සාමාන්‍ය හානිය	500	-	-	-	-
අසාමාන්‍ය හානිය	100	100	100	100	100
අවසන් තොගය	300	300	-	150	150
මුළු සමානුපාතික ඒකක	10,200	9,500	9,200	9,430	9,430
මාසය තුල දැරූ වියදම්		47,500,000	11,540,000	4,715,000	2,829,000
අඩු : සාමාන්‍ය හානියේ සුන්බුන් අගය (500 x 1000)		(500,000)			
ශුද්ධ පිරිවැය		47,000,000	11,540,000	4,715,000	2,829,000
මාසය තුල සාමානුපාතික ඒකකයක පිරිවැය		4,947	1,254	500	300

(ඇ) සාමාන්‍ය හානි ගිණුම

	ඒකක	වටිනාකම (රු.'000)		ඒකක	වටිනාකම (රු.'000)
පෙරසැරුැ II	500	500.00	මුදල් /ණයගැතියෝ	500	500.00
එකතුව		500.00	එකතුව		500.00

අසාමාන්‍ය හානි ගිණුම

	ඒකක	වටිනාකම (රු.'000)		ඒකක	වටිනාකම (රු.'000)
පෙරසැරුැ II	100	700.00	මුදල් /ණයගැතියෝ	100	100.00
			පෙරසැරි ලා/අ.		600.00
එකතුව		700.00	එකතුව		700.00

නිවේදනය

මෙහි ලබාදුන් පිළිතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම" යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු" ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දැක්වේ.

පිළිතුරු වලින් ප්‍රධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිඳු ප්‍රතිඥාහාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිඳු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

© 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.

සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.